සියලුම හිමිකම් ඇවිරිණි All Rights Reserved

# විහාරමහාදේවි බාලිකා විද්‍යාලය-කිරිබත්ගොඩ
# Viharamadevi Balika Vidyalaya-Kiribathgoda

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය
**General Certificate of Education (Adv.Level) Examiition**

13 වන ශ්‍රේණිය -තෙවන වාර පරීක්ෂණය 2025 සැප්තැම්බර්
Grade 13 3rd Term Test September 2025

ජීව විද්‍යාව I
**Biology I**

**09 S I**

**පැය දෙකයි.**
2 Hours .

**උපදෙස්**

- **සියලුම** ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ නම ලියන්න.
- **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1),(2),(3),(4),(5) යන පිළිතුරු වලින් **නිවරදිව හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙනල එය **පිළිතුරු පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (x ) යොදා දක්වන්න.**

AL API ( PAPERS GROUP )

01) ඩේලියා ආකන්ධවල සංචිත සංඝටකයේ තැනුම් ඒකකය වනුයේ,
1) ග්ලූකෝස් 2) ඉනියුලින් 3) ෆෘක්ටෝස් 4) ග්ලූකොසැමයින් 5) ග්ලැක්ටියුරොනික් අම්ලය

02) ජල ස්කන්ධ තුල ජලයට තාප ස්වාරක්ෂකයක් ලෙස ක්‍රියා කිරීමට හැකි වී ඇත්තේ ජලයේ,
1) සංසක්තිය හේතුවෙනි
2) ජලයේ ඉහළ වාෂ්පීකරණ තාපය හේතුවෙනි
3) ජලයේ ඉහළ පෘෂ්ඨීක ආතතිය හේතුවෙනි
4) හිමායනයේදී සිදුවන ප්‍රසාරණය හේතුවෙනි
5) අධික විශිෂ්ට තාපය හේතුවෙනි

03) පහත දී ඇති ප්‍රකාශ සලකා බලන්න
1) වර්ණදේහ සමක තලයේ පෙළ ගැසීම
2) යුගලනය වූ සමජාත වර්ණදේහ මංසල් වලදී විකර්ෂණය
3) ප්‍රතිවිරුද්ධ ධ්‍රැව දෙසට වර්ණ දේහාංශ ගමන් කිරීම
4) සමජාත වර්ණදේහ යුගල යෝග කලා තලය මත යුගලනය
5) වර්ණදේහ එක් එක් ධ්‍රැවයකට මුහුණලා සැකසීම

ඉහත ප්‍රකාශ අතරින් ඌනනය සහ අනුනනයට පොදු වනුයේ,
1) b, d 2) a, c, e 3) b, d, e 4) c, d 5) a, c

04) ප්‍රභා ශ්වසනය
1) සියලු ශාකවලට පොදු වූ සංසිද්ධියකි
2) RuBP ක්ෂය වේ
3) ශක්තය අවශෝෂණය කරගත් ක්‍රියාවලියකි
4) ATP නිෂ්පාදනය කරයි
5) ඔක්සිජනේස් ක්‍රියාවේදී සෑදෙන සියළු ඵල මයිටොකොන්ඩ්‍රියා සහ පෙරොක්සිසෝම වල වූ එන්සයිම මගින් බිඳ හෙලයි.

05) රතු රුධිරාණුවක එක් පයිරුවේට් අණුවකින් නිපදවෙන ATP සංඛ්‍යාව වනුයේ
1) 25 කි 2) 0 කි 3) 28 කි 4) 5 කි 5) 80 කි



CamScanner

07) ප්‍රෝටිස්ටා රාජධානිය හඳුන්වාදෙන ලද්දේ
1) රොබර්ට් එච්. විටෙකර් 2) අර්නස්ට් හේකල් 3) කාල් වූස්
4) ලිනේයස් 5) ඇරිස්ටෝටල්

08) ජෛව පරිණාමයේදී ආත්‍රොපෝඩා පූර්වජයින් බිහිවීමේ සිට ශාක කඳ, මූල, පත්‍ර ලෙස විභේදනය ඇරඹීම දක්වා කාලය තුල සිදුවූ වැදගත් සිදුවීම වනුයේ,
1) දිලීර භෞමික සනාවාසිකරණය 2) ස්පොන්ජින්ගේ පරිණාමය
3) පොරිෆෙරාවන් බිහිවීම 4) මුල්ම සිව්පාවා බිහිවීම
5) මානව පෙළපතේ ආරම්භය

09) ස්වාභාවික වර්ණවාදයේ නිරීක්ෂණ වනුයේ
1) උච්චතෝන්නතිය හා තරඟය 2) ප්‍රවේණික ප්‍රභේදන හා අධිජනනය
3) අධිජනනය හා තරඟය 4) උච්චතෝන්නතිය හා ස්වභාවික වරණය
5) ස්වභාවික වරණය හා තරඟය

10) පහත සඳහන් වගුවේ වූ ජීවීන්, ඔවුන් සතු ව්‍යුහ සහ ජීවත්වන පරිසරය නිවරදිව දක්වා ඇති මරණය වනුයේ

| | ජීවියා | ව්‍යුහය | ජීවත්වන පරිසරය |
|---|---|---|---|
| A | *Euglena* | P - ජවිකාව | කරදිය - I |
| B | *Amoeba* | Q - ඉපිල්ලා | මිරිදිය - II |
| C | *Paramecium* | R - සංකෝචන රික්තක | භෞමික - III |
| D | කුඩැල්ලා | S - අංශ පාදිකා | |

1) B, P, II 2) A, Q, II 3) C, P, II 4) D, S, III 5) A, R, III

11) එන්සයිම පිළිබඳ වඩාත් නිවැරදි ප්‍රකාශය වනුයේ,
1) එන්සයිමයේ සක්‍රිය ස්ථානයේ හැඩය සෑම විටම උපස්ථරයට අනුපූරක වේ.
2) එන්සයිම ප්‍රතික්‍රියාවට සහභාගි නොවන නිසා ප්‍රතික්‍රියාවට වැය නොවේ.
3) එන්සයිම උත්ප්‍රේරක ක්‍රියාවට සහසාධක අවශ්‍ය වේ.
4) බොහෝ විට ප්‍රතික්‍රියාවක අන්තඵල වල ගුණ වෙනස් නොකරයි.
5) එන්සයිමයේ සක්‍රිය ස්ථානය සෑදීමට ඇමයිනෝ අම්ල කිහිපයක් පමණක් සහභාගී වේ.

12) *Halobacterium* සහ *Helicobactor* පිළිබඳ නිවැරදි වනුයේ
1) *Halobacterium* සෛල බිත්තිය පෙප්ටිඩොග්ලයිකැන් දරයි.
2) *Helicobactor* RNA පොලිමරේස් බොහෝ ආකාර දරයි.
3) ජීවීන් දෙදෙනා පටල ලිපිඩ ශාඛනය නොවූ හයිඩ්‍රොකාබන් දරන අතර සමහර ජාන වල ඉන්ට්‍රෝන දරයි
4) ජීවී ආකාර දෙකම චක්‍රාකාර වර්ණ දේහ මෙන්ම ATP දරයි.
5) ජීවී විශේෂ දෙකේම ප්‍රෝටීන සංස්ලේෂණයේ ආරම්භක ඇමයිනෝ අම්ලය මෙතියොනීන් වන අතර විවිධ වාසස්ථානවල ජීවත් වේ.

13) ශාක සෛල සහ පටක පිළිබඳ සත්‍ය ප්‍රකාශය තෝරන්න.
1) ශාක පොත්ත ඉවත් කළද එම ඉවත් කළ ස්ථානයේ ෆ්ලෝයමීය පරිසංක්‍රමණය සිදුවේ.
2) ශාක පත්‍රයක මැද නාරටිය දෙපස ස්ථූල කෝණාස්ථර හෝ දෘඩස්ථර පටක දැකිය හැකිය.
3) ද්විතියික වර්ධනයක් සිදුවන ශාකවල අපිචර්මයේ වා සිදුරු දැකිය හැක.
4) ස්ථූල කොණස්ථර පටක ශාක මුල්වලට යාන්ත්‍රික සන්ධාරණයක් සපයයි.
5) ඒක බීජ පත්‍ර ශාකවල පාර්ශවික විභාජක දැකිය නොහැකි අතර අග්‍රස්ථ විභාජකයක් පමණක් දරයි



CS CamScanner

14) ශාක වල පූටිකා සහ උත්ස්වේදනය පිළිබඳ නිවැරදි වනුයේ,
1) පූටිකා යනු ශාක අපිචර්මයේ ඇති ව්‍යුහයන් වේ.
2) පාලක සෛල වටා ප්‍රත්‍යාස්ථ සෙලියුලෝස් ක්ෂුද්‍ර කෙඳිති අරීයව සැකසී ඇත.
3) කඳේ සනාල කැම්බියම් දැරුවද එවැනි ශාකවල වාසිදුරුමය උත්ස්වේදනයක් සිදු නොවේ.
4) පාලක සෛලවල ශූනතාවය වැඩිවන විට පාලක සෛලවල පරිමාව වැඩිවන නිසා සෛල ප්‍රසාරණය වී පූටිකා සිදුර වැසී යයි.
5) ABA වල ක්‍රියාකාරීත්වය හේතුවෙන් පාලක සෛලවල $K^+$ අයන සාන්ද්‍රණය වැඩිවේ.

15) ස්වාධීන ප්‍රභාසංස්ලේෂී ජන්මාණු ශාක දරනුයේ,
A) *Nephrolepis* B) *Cycas* C) *Hibiscus* D) *Diptorocarpus*
1) A, B, C පමණි 2) B, C පමණි 3) A පමණි 4) C, D පමණි 5) B පමණි

16) මහ බීජාණුව පුරෝහණයෙන් බාහිර පරිසරයේදී ජන්මාණු ශාඛායේ විකාශනය සම්පූර්ණ කරනුයේ
1) *Pogonatum* 2) *Nephrolepis* 3) *Selaginella* 4) *Cycas* 5) *Hibiscus*

17) ශාකවල ගුරුත්වාවර්ථී චලන පිළිබඳ සත්‍ය වනුයේ,
A) භෞමික ශාකවල ගුරුත්වය හඳුනාගැනීමට තුලාශ්ම දායක වේ.
B) මූලාග්‍ර කොපුවේ සමහර සෛලවල මෙම තුලාෂ්ම ඒකරාශි වී පවතී.
C) මුලේ සෛල විභාජනය වන කලාපයේ යටි පැත්තේ $Ca^{2+}$ සහ ඔක්සීන් ඒකරාශී වේ.
1) A, B, C සියල්ලමය 2) B හා C පමණි 3) B පමණි 4) A හා C පමණි
5) A හා B පමණි

18) ශාක මුල් හා එහි ක්‍රියාකාරිත්වය කෙරෙහි බලපාන ශාක වර්ධක ද්‍රව්‍ය වනුයේ
1) ඔක්සීන් හා ගිබෙරලින් 2) ඔක්සිජන් සහ ඇබ්සිසික් අම්ලය
3) සයිටොකයිනීන් හා ගිබෙරලින් 4) සයිටොකයිනීන් හා එතිලීන්
5) එතිලින් හා අබ්සිසික් අම්ලය

19) ලිග්නීන් පිළිබඳ සත්‍ය වනුයේ,
1) ද්විතීක පරිවෘත්තිජ කාණ්ඩයකි
2) ප්‍රේරිත ආරක්ෂක යාන්ත්‍රණ සඳහා දායක වේ.
3) ද්විතීක සෛල බිත්තියේ බහුලතම සංයෝගයයි.
4) සෛල බිත්තියේ ලිග්නීන් තැන්පත් වීමෙන් කුව ඇති වේ.
5) වර්ධනය අවහිර නොකර ශාක කොටස් වලට සන්ධාරණය සපයයි

20) ශාකවල කුරු වර්ධනය හා වියපත් පත්‍රවල හරිතක්ෂය යන ඌනතා ලක්ෂණ වලට හේතුවන ඛනිජ මූලද්‍රව්‍ය,
1) ශාකවල ඇති සියළුම කාබනික සංයෝගවල සංඝටක මූල ද්‍රව්‍යයකි.
2) එන්සයිම සක්‍රියකයකි.
3) ඒවා ජීවී දේහ සහ පස අතර පමණක් චක්‍රීකරණයට ලක් වේ.
4) ATP වල සංඝටයකි.
5) ඇනායන ලෙස පමණක් පාංශු ද්‍රාවණයෙන් අවශෝෂණය කරයි.

21) මිනිසාගේ අපිච්ඡද පටක පිළිබඳ නිවැරදි වනුයේ,
1) සියලුම සෛල දරණු පටලය මත පිහිටයි.
2) ස්‍රාවීය කෘත්‍යයක් ඉටු කරන අපිච්ඡදය සරල ඝනාකාර හෝ සරල ස්ථම්භික වේ.
3) ආන්ත්‍රික අපිච්ඡදය සෛල තැටි ආකාර වේ.
4) වරණීය ප්‍රතිශෝෂණයක් සිදුවන විදුර සංවලිතයේ ද්‍රව්‍ය ගමන් කිරීම කාර්යක්ෂම කිරීමට සරල ශල්කමය අපිච්ඡදයක් දරයි.
5) ශ්වසන පද්ධතියේ වායු ගමන් කරන මාර්ගය ව්‍යාජ ස්ථරිභූත අපිච්ඡදයයෙන් තැනී ඇත.



CS CamScanner

22) මිනිස් අක්මාව පිළිබඳ නිවැරදි වනුයේ,
1) උත්තර පෘෂ්ඨය අක්‍රමවත්ය.
2) ශඩාස්‍රාකාර අක්මා කණ්ඩිකා 4 කින් සෑදී ඇත.
3) හෙපැටොසයිට ස්වායු ශ්වසනයෙන් ATP 30 ක් නිපදවයි.
4) මධ්‍ය ශිරාවේ සිට කෝටරාභ වෙත රුධිරය ගලා යයි.
5) යාත්‍රෘතික ප්‍රතිහාර ශිරාවේ ශාඛා එක් වී යාකෘතික ශිරාව තනයි.

23) මූලික පරිවෘත්තිය වේගය (BMR) සහ ශක්ති අයවැය පිළිබඳ සත්‍ය වනුයේ
1) වැඩුනු පුරුෂයෙකුගේ සාමාන්‍ය BMR අගය 1600 - 1800 KCal වේ.
2) වැඩුනු පුරුෂයෙකුගේ සාමාන්‍ය BMR අගය වැඩුනු ස්ත්‍රියකගේ එම අගයට වඩා වැඩිය.
3) ශක්ති අයවැය සමීකරණයේ M මගින් නිරූපණය වනුයේ මූලික පරිවෘත්තියට අදාලව වැය වූ ශක්තියයි.
4) ශක්ති අයවැය සමීකරණයේ P මගින් නිරූපණය වනුයේ වර්ධනය සඳහා යොදාගත හැකි ශක්තියයි.
5) U මගින් ප්‍රජනනය සඳහා භාවිතා කළ හැකි ශක්තිය නිරූපනය වේ.

24) රුධිර වාහනයට විරුද්ධව ක්ෂණිකව ආරක්ෂාවක් ලබා දෙනුයේ,
1) කොලාජන් තන්තු මගිනි
2) පට්ටිකා පිණ්ඩය මගිනි
3) ෆයිබ්‍රින් තන්තු මගිනි
4) සක්‍රිය වූ ත්‍රොම්බින් මගිනි
5) හෙපරින් මගිනි

25) හෘද් සන්නායක පද්ධතිය හා එහි ක්‍රියාකාරිත්වය පිළිබඳ සත්‍ය වනුයේ
1) SA ගැටය දකුණු කර්ණිකාවේ උත්තර මහ ශිරාව විවෘත වන ස්ථානයේ පිහිටයි.
2) SA ගැටයෙන් ආවේග ආරම්භ කිරීමට ස්වයං සාධක ස්නායු සැපයුම අත්‍යාවශ්‍ය වේ.
3) AV ගැටයේ සිට මයෝකාඩියමේ අග්‍රය දක්වා විද්‍යුත් ආවේග සම්ප්‍රේෂණය වූ විට සංකෝචන තරංග කෝෂිකා බිත්තියේ ඉහළට හා පිටත ප්‍රදේශවලට විහිදේ.
4) හෘද සන්නායක පද්ධතියේ පර්කින්ජේ තන්තු මයෝකාඩියමේ පවතී.
5) සෛල ස්කන්ධයක් වන AV ගොණුව කර්ණිකාන්තර ආවාරයේ පිහිටයි.

26) පෘෂ්ඨවංශීන්ට හා අපෘෂ්ඨවංශීන්ට පොදු වූ ශ්වසන වර්ණකයක් වනුයේ
1) හිමෝග්ලොබින්
2) හිමෝසයනීන්
3) හිමෝ එරිත්‍රින්
4) මයෝග්ලොබින්
5) ක්ලෝරොකෘවොරින්

27) මිනිසාගේ අභ්‍යන්තර ශ්වසනයේදී
1) ඔක්සි හිමොග්ලබින් නිපදවයි
2) වායු හුවමාරුවෙන් පසු ගර්තවල $O_2$ ආංශික පීඩනය රුධිරයේ $O_2$ ආංශික පීඩනයට සමාන වේ.
3) පෘෂ්ඨාතති ශමක ශ්වසන පෘෂ්ඨ බිඳවැටීම වළක්වයි.
4) $O_2$ හර කිරීම සහ CO2 බැර කිරීම සිදුවේ.
5) මෙහිදී සාන්ද්‍රණ අනුක්‍රමණයට එරෙහිව $O_2$ පරිවහනය වේ.

28) ප්‍රදාහක ප්‍රතිචාර වලදී,
1) රුධිර වාහිනීවල පාරගම්‍යතාවය වැඩි වන බැවින් කුඹ සෛල හිස්ටැමින් ශ්‍රාවය කරයි.
2) රුධිර වාහිනීවල පාරගම්‍යතාවය වැඩිවන බැවින් මියගිය සෛල ඉවත්කිරීම පහසු කරයි.
3) භක්ෂක සෛල මගින් සයිටොක්සීන් නිදහස් කරවයි.
4) ප්‍රති ක්ෂුද්‍ර ජීවී ප්‍රෝටීන හේතුවෙන් අතිරේක භක්ෂ සෛලිකතාවයක් ඇති කරයි.
5) රුධිර වාහිනීවල පාරගම්‍යතාවය වැඩිවී පටක තරලය කාන්දුවීමෙන් වේදනාව ඇති වේ.



CS CamScanner

29) මිනිස් දේහයේ මුත්‍රා සෑදීමේදී,

1) අවිදූර සංවලිතයේදී සක්‍රියව $NH_3$ හා $H^+$ නාලිකා කුහරයට ස්‍රාවය කරයි.
2) අවිදූර සංවලිතයේදී අක්‍රියව $HCO_3^-$ ප්‍රතිශෝෂණය කළද විදූර සංවලිතයේ සක්‍රියව $HCO_3^-$ ප්‍රතිශෝෂණය කරයි.
3) හෙන්ලේ පුඩුවේ ආරෝහන බාහුවෙන් සක්‍රියව NaCl ප්‍රතිශෝෂණය කරන නිසා තනුක මුත්‍රා නිපදවයි.
4) විදූර සංවලිතය මත ක්‍රියා කරන ඇල්ඩස්ටරෝන් හෝමෝනය මගින් $Na^+$ හා ජල ප්‍රතිශෝෂණය වැඩි කරන අතර $K^+$ අක්‍රියව බහිස්‍රාවය කරයි.
5) සංග්‍රාහක ප්‍රණාලයේදී ප්‍රතිශෝෂණය වන ද්‍රව්‍යයන් වනුයේ NaCl හා ජලය වේ.

30) දෘෂ්ටි හා ශ්‍රවන ප්‍රතික සමායෝජනය සිදු කරනුයේ,

1) හයිපොතැලමස 2) සුෂුම්නා ශීර්ෂකය 3) අනු මස්තිෂ්කය
4) මධ්‍ය මොළය 5) සුෂුම්නාව

31) මිනිස් හිසේ ක්‍රියාකාරිත්වය පිළිබඳ සත්‍ය වනුයේ,

1) සමීප පෙනීමේ ක්‍රියාවලියේදී ප්‍රතියෝජක පේශි ලිහිල් වී ප්‍රතියෝජක දේහය පිටතට සහ කාචය දෙසට චලනයයි.
2) සමීපයේ වූ වස්තූන් නිරීක්ෂණය කිරීමේදී අක්ෂි ගෝලයට සම්බන්ධ බාහිර අක්ෂි පේශි දායක වන අතර එය ඉච්ඡානුග පාලනයට අයත් ය.
3) කාචයේ වර්තන බලය වෙනස්වීමේදී ප්‍රතියෝජක පේශී සංකෝචනය හා අක්ෂි ප්‍රතියෝජනය කිරීම ප්‍රත්‍යානුවේගී ස්නායු මගින් සිදු කරයි.
4) දුර ඇති වස්තූන් නිරීක්ෂණය කිරීමේදී කාචයේ අවලම්භක බන්ධනි ඉහිල් වී කාචයේ උත්තල භාවය අඩු කරයි.
5) පැහැදිලි ප්‍රතිබිම්බයක් දෘෂ්ඨි විතානය මත ලබා ගැනීමට අක්ෂි ප්‍රතියෝජනය හා කණීනිකාවේ ප්‍රමාණය පාලනය කළ යුතුය.

32) මානව ශුක්‍රාණු ජනනය සහ අන්ඩෝද්භවය පිළිබඳ නිවැරදි වනුයේ,

1) මුත්‍රධර නාලිකාවේ ශුක්‍රාණු මාතෘ සෛලයකින් පරිනත ශුක්‍ර සෛලයක් නිපදවීමට ගත වන කාලය ආරම්භයේ සිට අවසානය දක්වා සති හතරක් පමණ ය.
2) කලල අවස්ථාවේ මූලික ජන්මාණු සෛල අනූනනයෙන් බෙදී ශුක්‍රාණු මාතෘ සෛල ඇති කරයි.
3) ශුක්‍රාණු ජනනය දිරිගැන්වීම සිදුකරන හෝමෝන ස්‍රාවය කිරීම ලේඩිග් සෛල මගින් සිදු කරයි.
4) ස්ත්‍රී කළල අවස්ථාවේදී මූලික ජන්මාණු සෛල අනූනනයෙන් බෙදී ඩිම්බ ජනනය ඇරඹී එයින් අණ්ඩ මාතෘ සෛල ඇති කරයි.
5) උපතට පෙර ස්ත්‍රී ඩිම්බ කෝෂයේ වූ අණ්ඩ මාතෘ සෛල ඌනන විභාජනයේ දෙවන පියවර ආරම්භ කිරීමට සූදානම් ව පවතී

33) මානව කශේරුක මඩල ලිස්සීම, අස්ථි වෛවර්වය හා ඔස්ටියෝ ආතරයිටිස් යන අසාමාන්‍යතා වලදී,

1) අස්ථි තැන්පත්වීමේ වේගයට වඩා ප්‍රතිශෝෂන වේගය වැඩිවීම අස්ථි පවර්දාහයට හේතු වේ.
2) අස්ථි වෛවර්වය කෙරෙහි පාරිසරික සාධක ද හේතු වේ.
3) ඔස්ටියෝ ආතරයිටිස් තත්ත්වය මගින් කංකාල විරූපතා ඇතිවිය හැක.
4) ඔස්ටියෝ පොරෝසිස් තත්ත්වය නිසා සන්ධිවල චලන සීමා වන අතර සන්ධාන කාටිලේජ ක්‍රමයෙන් තුනී වී අස්ථි ක්ෂය වීම සිදුවේ.
5) අන්තර් කශේරුක මඩලේ බාහිරින් පිහිටි කාටිලේජ මුදුව පිටතට ලිස්සීම මඩල ලිස්සීම නම් වේ.

34) මිනිසාගේ ඇස්වල වර්ණය මෙන්ඩලිය ලක්ෂණයකි. දුඹුරු ඇස් නිල් ඇස් වලට ප්‍රමුඛ වේ. නිල් ඇස් සහිත පිරිමියෙකු දුඹුරු ඇස් සහිත කාන්තාවක් සමග විවාහ වූයේ නම් ඔවුන්ගේ පළමු දරුවා නිල් ඇස් සහිත වීමට ඇති සම්භාවිතාව,

1) 0% 2) 25% 3) 50% 4) 75% 5) 100%



CamScanner

35) මිනිසාට වැළඳෙන පහත සඳහන් ආවේණික රෝග අතරින් අතිරේක වර්ණ දේහයක් තිබීම නිසා හටගන්නා රෝගයක් වනුයේ,

1) හිමෝෆීලියාව 2) දෑකැති සෛල රක්තහීනතාවය 3) වර්ණාන්ධතාවය
4) ඇල්කැප්ටොනියුරියාව 5) ඩවුන්ගේ සහ ලක්ෂණය

36) පොල්මරේස් දාම ප්‍රතික්‍රියාව/ PCR පිළිබඳ නිවැරදි වනුයේ,

1) PCR හි මූලිකය නියුක්ලියෝටයිඩ සුළු සංඛ්‍යාවක් සහිත විශිෂ්ඨ RNA අනුක්‍රමයකි.
2) භාවිතා කරන විශිෂ්ඨ නියුක්ලියෝටයිඩ අනුක්‍රමය ඉලක්ක DNA වල 3' අන්තයේ අනුක්‍රමයට අනුපූරක වේ.
3) තාපානුශීත යුගලනයේදී PCR මිශ්‍රණයේ 95°C රත්කර සිසිල් කරයි.
4) තාපානුශීත යුගලනය වන උෂ්ණත්වය මූලිකයේ දිග මත පමණක් රඳා පවතී.
5) ප්‍රථම තාපජ චක්‍රයක අවසානයේ එක් එක් දාමයෙන් පිටපත් 1 කට වඩා වැඩි සංඛ්‍යාවක් ලැබේ.

37) කිසියම් පරිපූර්ණ ගහනයක මුළු ජීවීන් සංඛ්‍යාව 10,000 කි. එයින් 3200 ක් විෂම යුග්මක වේ. සමයුග්මක ප්‍රමුඛ හා සමයුග්මක නිලීන ජාන දරන්නන් අතර අනුපාතය 16.1 ක් නම් ගහනයේ නිලීන සමයුග්මක ජාන දරන පුද්ගලයින් සංඛ්‍යාව වනුයේ,

1) 3200 2) 6400 3) 4800 4) 1600 5) 4000

38) පහත සඳහන් ජීවීන්ගේ පරිසර පද්ධති නිවැරදිව දක්වා ඇති වරණය තෝරන්න.

a) කීන b) ගිණි අන්දර c) කටු ඉකිලි d) *Salicornia*

1) නිවර්තන තෙත් පහත රට වැසි වනාන්තර, නිවර්තන වියළි මිශ්‍ර සදාහරිත වනාන්තර, විල්ලු, නිවර්තන කටු කැලෑ
2) නිවර්තන වියළි මිශ්‍ර සදාහරිත වනාන්තර, නිවර්තන කඳුකර වනාන්තර, විල්ලු, ලවණ වගුරු
3) නිවර්තන කටු කැලෑ, නිවර්තන කඳුකර වනාන්තර, කඩොලාන, විල්ලු
4) නිවර්තන කඳුකර වනාන්තර, නිවර්තන කටු කැලෑ, කඩොලාන, ලවණ වගුරු
5) නිවර්තන තෙත් පහතරට වැසි වනාන්තර, නිවර්තන කඳුකර වනාන්තර, ලවණ වගුරු, කඩොලාන

39) වාණිජමය වශයෙන් සෙලියුලේස් නිපදවීම සඳහා භාවිතා කරන ක්ෂුද්‍ර ජීවියා විසින් ස්‍රාවය කරනු ලබන තවත් කාබනික සංයෝගයක් වනුයේ,

1) ලයිපේස 2) සිට්‍රික් අම්ලය 3) ඉන්වටේස් 4) විටමින් B12 5) රයිබො ෆ්ලේවින්

40) Occult Filariasis පිළිබඳ සත්‍ය වනුයේ,

1) Arbovirus මගින් සාදන වාහකයෙකු මගින් පැතිරෙන රෝගයකි.
2) වාහකයාගේ බිත්තර 1mm පමණ වන අතර ආරම්භයේදී සුදු පැහැ වුවද බිත්තර දමා විනාඩි කිහිපයකට පසු දිලිසෙන සුළු කළු පැහැ ගනී
3) රෝග ලක්ෂණ ලෙස අධික තෙහෙට්ටුව, අක්මාව විශාල වීම යනාදිය වන අතර මීළඟ පැය 24-48 ක උග්‍ර අවස්ථාව මාරාන්තික විය හැක.
4) අත් පා, වෘෂණ යනාදියෙහි වසා තරලය එකතුවීමත්, චර්ම ප්‍රදාහය සහ රුධිර පට්ටිකා ප්‍රමාණයත් අඩු කරයි.
5) අධික ඉයොසිනොෆිල් සංඛ්‍යාවක් තිබීම, නිදන්ගත කැස්ස, පපුවේ වේදනාව, උණ සහ බර අඩුවීම ලාක්ෂණිත ලක්ෂණ වේ.



CS CamScanner

අංක 41-50 දක්වා ප්‍රශ්නවලදී ඇති ප්‍රතිචාර අතුරෙන් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ නිවැරදිය. කවර ප්‍රතිචාරය/ප්‍රතිචාර නිවරදිද යන්න පළමුවෙන් විනිශ්චය කරන්න. ඉන්පසු නිවැරදි අංකය තෝරන්න.

| | උපදෙස් සැකෙවින් | | | | |
|---|---|---|---|---|---|
| පිළිතුරු අංක | (1) | (2) | (3) | (4) | (5) |
| නිවැරදි ප්‍රතිචාර | (A), (B), (D) | (A), (C), (D) | (A), (B) | (C), (D) | වෙනත් කිසියම් ප්‍රතිචාරයක් හෝ ප්‍රතිචාර සංයෝජන නිවැරදිය |

41) නිශේධක පිළිබඳ සත්‍ය ප්‍රකාශය / ප්‍රකාශ වනුයේ,
A) තරඟකාරී නිශේධක එන්සයිමයේ සක්‍රීය ස්ථානය සඳහා උපස්ථර සමග වරණීයව තරඟ කරයි.
B) නිශේධක දුර්වල බන්ධන මගින් ප්‍රත්‍යාවර්ථව හෝ සහසංයුජ බන්ධන මගින් අප්‍රතිවර්ත්‍ය ලෙස බැඳේ.
C) ක්ෂුද්‍ර ජීවීන්ට එරෙහිව ලබාදෙන ඖෂධ අප්‍රතිවර්ථ නිශේධක වේ.
D) තරඟකාරී නොවන නිශේධකවල බලපෑම බොහෝ විට ප්‍රත්‍යාවර්ථ වේ.
E) තරඟකාරී නොවන නිශේධකවල හැඩය සක්‍රිය ස්ථානයේ හැඩයට සමාන වේ.

42) Phylum Platyhelminthes හි ලාක්ෂනික ලක්ෂණයත්/ලක්ෂණ වනුයේ,
A) අසම්පූර්ණ ආහාර ජීර්ණ පද්ධතියක් දැරීම.
B) නිදළිවාසින් කිට අවධි රහිත විකසනය වීම.
C) පෘෂ්ඨය මස්තිශ්ක ගැංගලියම්, ස්නායු රැහැනක් සහ වලයාකාර සම්බන්ධක සහිත ස්නායු පද්ධතියක් දැරීම.
D) ඒක ලිංගික ජීවීන් දැරීම හා ප්‍රාග් වෘක්කිකා සහිත වීම.
E) ද්විපාර්ශ්වික සමමිතිය දරන මෙන්ම අසමමිතික දේහ සහිත ජීවීන් සිටීම.

43) ෆයිටොක්‍රෝම්වල බලපෑමක් / බලපෑම් වනුයේ,
A) බීජ ප්‍රරෝහණයේදී බීජ පැලය පස මතුපිටට පැමිණි පසු බීජාධරය දික්වීම නිශේධනය
B) *Mimosa pudica* වල පත්‍ර හැකිලීම.
C) ශාඛ සෙවණ මග හැරීම.
D) පුෂ්ප හටගැනීම.
E) ප්‍රභාවර්ථනය.

44) මිනිස් ආහාර මාර්ගයේ ජලය අවශෝෂණය සිදුවන ස්ථානයක්/ස්ථාන වනුයේ,
A) ආමාශය B) අක්මාව C) මහා අන්ත්‍රය D) කුඩා අන්ත්‍රය E) අග්න්‍යාශ

45) මිනිසාගේ ගර්ථ පිළිබඳ සත්‍ය ප්‍රකාශය/ප්‍රකාශ වනුයේ,
A) සරල අපිච්ඡදයක් දරයි
B) සුදු රුධිරාණු දරයි
C) ගර්ථ සහ රුධිර කේශනාලිකා අතර පෘෂ්ඨාතතිශමක දරයි
D) ව්‍යුහාත්මක මල අවකාශ පරිමාවට ගර්ත තුල අන්තර්ගත වාතය ඇතුලත් වේ.
E) සිනිඳු පේශී දරයි.

46) මිනිස් මධ්‍ය ස්නායු පද්ධතියේ කෘත්‍යයන් කිහිපයක් පහතින් දක්වා ඇත. මේවා අතරින් අපර මොළයෙන් විකසනය වන කොටස්වල කෘත්‍යය/කෘත්‍යයන් වනුයේ,
A) ආහාර රුචිය යාමනය
B) දෘෂ්ටි හා ශ්‍රවණ ප්‍රතික සමායෝජනය
C) ඉරියව්ව සහ සමබරතාව පවත්වා ගැනීම
D) කැස්ස, කිවිසීම වැනි අනිච්ඡානුග ප්‍රතික ක්‍රියා පාලනය
E) ඉච්ඡානුග පේශී සංකෝචනය ආරම්භය හා පාලනය



CS CamScanner

47) DNA විසංගමනය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරින් සත්‍ය ප්‍රකාශය/ප්‍රකාශ වනුයේ
A) DNA විසංගමනයේදී පළමු පියවර සඳහා ලයිසොසයිම් භාවිතා කළ හැක.
B) සෛල බිඳ දැමීමෙන් පසු DNA හායනය වීම වැළැක්වීමට නියුක්ලියේස වල ක්‍රියාකාරිත්වය අවශ්‍ය බැර ලෝහ ඉවත් කළ යුතු ය.
C) DNA දාම දෙක බිඳ වැටීම වැළැක්වීමට DNA විසංගමනය ක්‍රියාවලියෙහි SSD/තනි දාම බන්ධක ප්‍රෝටීන එක්කරයි.
D) ක්ෂාලක මගින් සෛල බිත්ති බිඳ දැමීම හෝ ජාරණය සිදු කරයි.
E) අපවිත්‍රකාරක ඉවත් කිරීමට ශීත කළ එතනෝල් එක් කරයි.

48) අන්තර්ජාතික සම්මුතීන් පිළිබඳ නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ වනුයේ,
A) CITES - ජෛව විද්‍යාත්මක විවිධත්වය සංරක්ෂණය කිරීම එක් අරමුණකි.
B) රැම්සාර් සම්මුතිය - වන සතුන්ගේ අං, සම් වැනි නිදර්ශක සහ සම්පූර්ණ ශාක හෝ සත්ත්ව කොටස් වෙළඳාම මගින් ඒවායේ පැවැත්මට තර්ජනයක් නොවන බව තහවුරු කිරීම අරමුණකි.
C) මාපෝල් සම්මුතිය - ක්‍රියාන්විත මගින් හෝ අහම්බෙන් හෝ සිදුවන නැව් මගින් පරිසර දූෂණය වැළැක්වීම අරමුණකි.
D) කියොතෝ සම්මුතිය - හරිතාගාර වායු විමෝචන ඉලක්ක මට්ටම කරා අඩුකිරීම අරමුණකි.
E) බාසල් සම්මුතිය - ඕසෝන් ස්ථරය ක්ෂය කරන ද්‍රව්‍යවලට අදාලව $O_3$ ස්ථරය ආරක්ෂා කිරීම අරමුණකි.

49) ආහාර නරක්වීමේදී සිදුවන භෞතික සහ රසායනික විපර්යාසයන් පිළිබඳ සත්‍ය ප්‍රකාශය/ප්‍රකාශ වනුයේ,
A) ප්‍රෝටීනමය ආහාර ප්‍රතිභවනයේදී ප්‍රෝටියොලිටික එන්සයිම මගින් ඇමයිනෝ අම්ල, ඩයිපෙප්ටයිඩ හා $H_2S$ බවට බිඳ දමයි.
B) ප්‍රෝටීනමය ආහාර නරක් වීමේදී සෙවල සහ මැලියම් ඇති කරයි.
C) කාබෝහයිඩ්‍රේටමය ආහාර සැකරොලිටික ක්ෂුද්‍ර ජීවීන් ශ්‍රාවය කරන එන්සයිම මගින් සීනි, කාබෝහයිඩ්‍රේටමය අම්ල, මධ්‍යසාර සහ වායු බවට පත් කරයි.
D) ලිපිඩමය ආහාර නරක්වීමේදී ඒවා ලිපොලිටික ක්ෂුද්‍ර ජීවීන්ගේ එන්සයිම මගින් මේද අම්ල හා ග්ලිසරෝල් බවට පරිවර්තනය කරයි.
E) ආහාර නරක්වීමේදී ආහාරවලට විෂ එකතු වී ආහාර ඝන බවට පත් වේ.

50) මූලික සෛල චිකිත්සාව පිළිබඳ සත්‍ය ප්‍රකාශය/ප්‍රකාශ වනුයේ,
A) බ්ලාස්ට කෝෂ්ඨයේ ඇතුලු සෛල පිඩ කළල මූලික සෛල වල ප්‍රභවය වේ.
B) කළල මූලික සෛල වලට මිනිස් දේහ සෑදී ඇති සෛල ආකාර කිහිපයකට විභේදනය විය හැක.
C) මිනිස් කළල මූලික සෛල වලට තව තවත් මූලික සෛල නිපදවීම සඳහා අසීමාන්තික ලෙස තම සෛල ස්වයං නව්‍යකරණය කළහැක.
D) පරිණත මූලික සෛල බොහෝ පටක වල පිහිටයි.
E) ප්‍රායෝගිකව පටක අලුත්වැඩියාව කෙරෙහි බහුලව භාවිතා කරනුයේ පරිණත මූලික සෛල වේ.

AL API ( PAPERS GROUP )



CamScanner

AL API

PAPERS GROUP

CamScanner